**හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 - 2024**

**------------------------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 හි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර එම වාර්තාවල කාරක සභා 02 ක් සඳහා ව්‍යාවනය කළ මතයක් සහ කාරක සභා 15 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණ අතර, ඊට හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලුණම හා යෝධකණ්ඩිය ගොවිජන සේවා කාරක සභාවන්හි මූල්‍ය ප්‍රකාශය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව පිළියෙල කර ඉදිරිපත් කළයුතු වුවත්, එපරිදි කටයුතු නොකර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | 2025 වර්ෂයේ ගිණුම් වාර්තා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව පිළියෙල කර ඉදිරිපත් කළ යුතු අතර අදාළ පරිදි ගිණුම්වල ගැලපීම් කළ යුතුය . |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 10 ක සමාලෝචිත වර්ෂයට අදාළ විවිධ විෂයන්ට අයත් වියදම් රු.894,067 ක් අඩුවෙන් සහ ලුණම ගොවිජන සේවා කාරක සභාවෙහි විවිධ විෂයන්ට අයත් වියදම් රු.239,938 ක් වැඩියෙන්ද, කාරක සභා 4 ක විවිධ විෂයන්ට අදාළ ආදායම් රු.1,220,576 ක් අඩුවෙන් සහ කාරක සභා 3ක ආදායම් රු.1,228,914ක් වැඩියෙන්ද, කාරක සභා 04 ක ජංගම වත්කම් රු.705,139 අඩුවෙන් සහ | 2025 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ ආදායම්, වියදම්, වත්කම්, වගකීම් හා හිමිකම් වටිනාකම් නිවැරදිව ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතු අතර, අදාළ පරිදි ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාරක සභා 02ක රු.27,103,470ක් වැඩියෙන්ද, කාරක සභා 03 ක ජංගම වගකීම් රු.612,359ක් අඩුවෙන් සහ කාරක සභා 02ක රු.27,225,700ක් වැඩියෙන්ද, කාරක සභා 04ක සමුච්චිත අරමුදල රු. 725,470 ක් අඩුවෙන් සහ කාරක සභා 06ක රු.4,874,220ක් වැඩියෙන්ද, කාරක සභා 04 ක ප්‍රත්‍යාගණන සංචිතය රු.10,553,160 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | | |
| (ආ) | ස්ථාවර වත්කම්වල පිරිවැය කාරක සභා 12ක රු.10,707,809 ක් අඩුවෙන් සහ කාරක සභා 03ක රු.1,248,975 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර කාරක සභා 12ක පිහිටි ඉඩම්, මයුරපුර කාරක සභාවේ තණකොළ කපන යන්ත්‍රය, ලුණම කාරක සභාවේ යතුරුපැදිය, වලස්මුල්ල කාරක සභාවේ පරිගණකය හා කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රය සහ බෙරලිහෙල කාරක සභාවේ ට්‍රැක්ටර් රථයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මධ්‍යස්ථානවල ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව හා අනෙකුත් දෝෂයන් 2025 වර්ෂයේ ගිණුම් වාර්තාවල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනයෙහි නිවැරදිව ඉදිරිපත් කිරීමත්, කාරක සභාව පිහිටි ඉඩමෙහි වටිනාකම සහ අනෙකුත් ස්ථාවර වත්කම් වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමත් කළ යුතුය. |
| (ඇ) | අඟුණුකොළපැලැස්ස ගොවිජන සේවා කාරක සභාවෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති රු.622,662 ක ලී බඩු උපකරණ ශේෂයෙහි සහ රු.1,560,209 ක විදුලි උපකරණ ශේෂයෙහි පාරිභෝජ්‍ය භාණ්ඩවලට අදාළ පිරිවැය ඇතුළත් වීමෙන් ජංගම නොවන වත්කම් වැඩියෙන් දැක්වුණු අතර, ඊට අදාළ ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දැක්වුණි. | 2025 වර්ෂයේ ගිණුම් වාර්තාවෙහි නිවැරදි කර දැක්වීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් ගිණුම්වල ගැලපිය යුතුය. |
| (ඈ) | උඩයාල ගොවිජන සේවා කාරක සභාවේ ආදායම් සහ වියදම් උපචිත පදනම මත ගිණුම් තබා ඇති බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා ඇතත්, අක්කර බදු ආදායම් ගිණුම් තැබීමේදී වර්ෂය තුල මුදලින් ලැබී තිබුණු රු.552,454 ක් වර්ෂයේ ආදායම ලෙස මුදල් පදනමින් ගිණුම් තබා තිබුණි. | 2025 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ඉ) | ලුණම ගොවිජන සේවා කාරක සභාවෙහි ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ දැක්විය යුතු එකතු වටිනාකම රු.570,571ක් වූ අයිතම 03ක් ලී බඩු හා කාර්යාල උපකරණ යටතේ | 2025 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් හඳුනාගෙන නිවැරදිව වර්ගීකරණය අනුව ගිණුම්ගත කර හෙළිදරව් කර ඇති ක්ෂය අනුපාත |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්ගත කර තිබුණි. ගිණුම් ප්‍රතිපත්ති අනුව මෙම අයිතම 03 සමාලෝචිත වර්ෂයේ පිරිවැය මත සියයට 05 බැගින් වාර්ෂික ක්ෂය කළ යුතු වුවත්, ඒ සඳහා සියයට 10 බැගින් හීනවන ක්ෂය ක්‍රමය යටතේ රු.376,553ක් ගිණුම්ගත කර තිබුණි. | | යටතේ ක්ෂය කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ඊ) | ලුණම ගොවිජන සේවා කාරක සභාවෙහි ජර්නල් සටහන් අංක 20 හා 35 මඟින් පිළිවෙලින් රු. 101,043ක් හා රු. 122,070ක් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් ගිණුමට හර හා බැරකරන බවට දක්වා තිබුණද එම වටිනාකම එම ගිණුමටම ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ අවසාන ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ගිණුම්ගත කිරීමේදී සහ සමාලෝචිත වර්ෂයේ මාසික ශේෂ ඉදිරියට ගෙන යාමේදී ජංගම ගිණුම් 03 ක ශේෂ රු2,589,242 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2025 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | ජර්නල් සටහන් මගින් කරනු ලබන ගැලපීම් අදාළ ගිණුම්වල සටහන් කිරීමට සහ පෙර මස ශේෂයන් ඉදිරියට ගෙනයාම නිවැරදිව සටහන් කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් කළ යුතුය. |
| (උ) | මීගස්ආර ගොවිජන සේවා කාරක සභාවෙහි ඉකුත් වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා තිබුණු කාරක සභා ඉඩම් හා ගොඩනැගිලිවල ධාරණ වටිනාකම ප්‍රත්‍යාගණනය හේතුවෙන් වැඩි වූ වටිනාකම ලෙස අයිතම 02 ක් යටතේ ඉදිරිපත් කිරීමේ ගිණුම්කරණ දෝෂය සමාලෝචිත වර්ෂයේදී නිවැරදි නොකර ඉඩම් හා ගොඩනැගිලි රු.1,809,380ක් හා ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය රු.1,405,544 ක් ලෙසද ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගතකර තිබුණි. | 2025 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | පෙර වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා තිබූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඌ) | උඩයාල ගොවිජන සේවා කාරක සභාවේ භෞතිකව පැවති කිලෝග්‍රෑම් 288.1 ක් වූ පොහොර තොගයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර වලස්මුල්ල කාරක සභාවේ භෞතිකව නොපවතින යූරියා කිලෝග්‍රෑම් 420 ක් තොග ගිණුමේ දක්වා තිබුණි. | උඩයාල කාරක සභාවේ තොග වටිනාකම සොයා ගැනීමට සාක්ෂි නොමැති බවත්, 2025 ආරම්භක ශේෂ සටහන් කිරීමේදී නිවැරදි කරන බව. | තොග චලනයන් නිවැරදිව ලේඛනගත කරමින් යාවත්කාලීව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය . |

### 1.3.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 06ක ගිණුම් විෂයයන් 16කට අදාළ මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා වටිනාකම් අතර එකුතුව රු.5,425,166 ක නොසැසඳීම් පැවතුණි. | 2025 වර්ෂයේ ගිණුම් වාර්තා වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන අගයන් අනුරූපී වාර්තාවල අගයන් සමග සමාන විය යුතුය. අසමානකම් සම්බන්ධයෙන් කඩිනමින් සැසඳීමක් කර නිවැරදි කිරීම් කළ යුතුය . |
| (ආ) | කටුවන ගොවිජන සේවා කාරක සභාවෙහි වැඩිමිල පොහොර අවසන් තොග ශේෂය වූ රු.1,330,925 ක් වෙළඳ ගිණුමෙහි, ප්‍රමාණාත්මක තොග ගිණුමෙහි හා ලෙජර් ගිණුමෙහි එකිනෙකට වෙනස් වටිනාකම් දක්වා තිබුණි. | 2025 වර්ෂයේ ගිණුම් වාර්තාවල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව. | - එම - |

### 1.3.3 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 15 ක රු.125,535,326 ක් වූ වත්කම්, කාරක සභා 05ක රු.99,399,274 ක් වූ වගකීම්, ලුණම ගොවිජන සේවා කාරක සභාවේ රු.1,273,816 ක් වූ ආදායම් ශේෂ, මිගස්ආර ගොවිජන සේවා කාරක සභාවේ රු.198,262ක වියදම් ශේෂ, බෙරලිහෙළ ගොවිජන සේවා කාරක සභාවෙහි රු.336,161ක තොග හානිය, කාරක සභා 02 ක රු. 132,151,541 ක් වූ ජර්නල් සටහන් 7ක් සහ ලුණම ගොවිජන සේවා කාරක සභාවෙහි රු.132,461ක ලදුපත් 02ක් සත්‍යාක්ෂණය සහ සන්නිරීක්ෂණය කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2025 ගිණුම් වාර්තාවල නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය සටහන්, වාර්තා සහ ලේඛන ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ශේෂයන් සෑදුමලත් ආකාරය දැක්වෙන විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| | 56(3) හා (4) වගන්ති | ගොවිජන සේවා කාරක සභා 09 ක වගකිව යුතු නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.1,137,023 වූ හිඟ අක්කර බදු අයකර ගෙන නොතිබුණි. | හිඟ අක්කර බදු අයකර ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කළ බව. | හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, කාලීනව අය නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | i. මුදල් රෙගුලාසි 103 හා 104 | බෙරලිහෙල ගොවිජන සේවා කාරක සභාවේ 2023 වර්ෂයේ සමීක්ෂණ වාර්තාව මගින් හඳුනාගෙන තිබුණු ඌනතා භාණ්ඩ, හානි පිළිබඳ ලේඛනයක ඇතුළත් කර නොතිබුණු අතර, ඌනතා සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඌනතා භාණ්ඩ හා හානි පිළිබඳ ලේඛනයක් සකස් කරන බව. | හානි පිළිබඳ විස්තර ලේඛනගත කර ඌනතා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි 110 | ගොවිජන සේවා කාරක සභා 03 ක හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදී හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කරන බව. | ලේඛන පිළියෙල කර යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. මුදල් රෙගුලාසි 156(1)(අ) | යම්කිසි නිලධාරියෙකුගේ ප්‍රමාදයන් නොසැකිල්ලක් වරදක් හෝ වංචාවක් හේතු කොට ගෙන රජයට සිදුවන ඕනෑම පාඩුවක් සම්බන්ධයෙන් ඒ නිලධාරියා පෞද්ගලිකව වගකිව යුතු අතර එමගින් සිදුවන පාඩුව පූර්ණය කළයුතු වුවද වීරවිල කාරක සභාව විසින් පහත අවස්ථා වලදී එලෙස කටයුතු කර නොතිබුණි. | | |
| | • 2024 ජූලි 05 දින අලෙවි කර තිබුණු යූරියා පොරෙහාර වලට අදාළ රු.180,000ක මුදලක් මධ්‍යස්ථාන ලිපිකරු බැංකු ගත නොකර තිබුණු අතර විගණිත දින වූ 2025 අප්‍රේල් 22 දින වන විටත් එම මුදල් අයකර ගෙන නොතිබුණි. | සංවර්ධන නිලධාරි මහත්මියක් විසින් ගෙවිය යුතු ඉතිරි මුදල් බව. | රජයට සිදුකළ පාඩුව අදාළ පාර්ශව වෙතින් කඩිනමින් අය කරගැනීමට සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| | • ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2022 සැප්තැම්බර් 13 දිනැති අංක 7/2/10/1855 දරන ලිපිය මගින් ලබා දී ඇති නියෝග පරිදි පොහොර තොගයක් අස්ථානගත වීමට අදාළව නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.546,468ක් වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන නිලධාරි මියකගෙන් හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහත්මයකු විසින් ගෙවිය යුතු බව. | රජයට සිදුකළ පාඩුව අදාළ පාර්ශව වෙතින් කඩිනමින් අය කරගැනීමට කටයුතු කළ යුතුය. |
| | • 2024 මැයි 28 දිනැති අංක SPCG/HM/B/ WEAS/23/14 දරන ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින්ද පෙන්වාදී තිබුණු යූරියා තොග කිලෝග්‍රෑම් 2977.46 සහ MOP කිලෝග්‍රෑම් 717.5ක ඌණතාවය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට විගණිත දින වූ | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂණයක් පවත්වා ගෙන යන බව. | අදාළ පරීක්ෂණය කඩිනමින් අවසන් කිරීමට, ඒ අනුව රජයට සිදුකළ පාඩුව අදාළ පාර්ශව වෙතින් කඩිනමින් අය කරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2025 අප්‍රේල් 22 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | | |
| iv. මුදල් රෙගුලාසි 177 | දෛනිකව ලැබෙන මුළු ආදායම දිනපතා හෝ හැකිතාක් ඉක්මණින් ප්‍රේෂණය කළයුතු වුවද, වීරවිල හා මීගස්ආර මධ්‍යස්ථාන වල මුළු ආදායම දෛනිකව බැංකුගත නොකළ අවස්ථා පැවතුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව කටයුතු කරන බව. | දෛනිකව ලැබෙන මුළු ආදායම දිනපතා හෝ හැකිතාක් ඉක්මණින් ප්‍රේෂණය වන පරිදි අභ්‍යන්තර පාලනය ශක්තිමත් කල යුතුය. |
| v. මුදල් රෙගුලාසි 257 | බෙලිඅත්ත කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී වවුචර් අංක 114 මගින් පොහොර ණය බිල් පියවීම සඳහා රු.50,000 ක් ගෙවීම් කිරීමේදී ගෙවීම සහතික කර නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව කටයුතු කරන බව. | ගෙවීම් වවුචරය සහතික කිරීමෙන් පසු ගෙවීම් සිදු කළ යුතු අතර එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| vi. මුදල් රෙගුලාසි 316 | රජයේ සියලුම මුදල් සේප්පුවල හා ආරක්ෂිත පෙට්ටිවල තැන්පත් කළ යුතු වුවත්, කාරක සභා 06 ක ගොවි බැංකු සඳහා සේප්පුවක් භාවිතා කර නොතිබුණි. | අක්‍රීය වී ඇති සේප්පු සම්බන්ධව දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇති බව. | රජයේ සියලුම මුදල් සේප්පුවල හා ආරක්ෂිත පෙට්ටිවල තැන්පත් කළ යුතු අතර, ඒ සඳහා වහාම පියවර ගත යුතුය. |
| vii. මුදල් රෙගුලාසි 371 | තත්කාර්ය සඳහා ලබාගන්නා ලද අතුරු අග්‍රිම අදාළ කාර්ය නිම වූ වහාම හෝ එය ලබාගත් දින සිට දින 14ක් ඇතුළත පියවිය යුතු වුවත්, ලුණම කාරක සභාවේ 2024 අප්‍රේල් 01 දින පැවති අලුත් සහල් මංගල්‍ය වෙනුවෙන් ලබාගෙන තිබූ රු.200,000ක අත්තිකාරම් විගණිත දිනය වූ 2025 ජුනි 12 වන විටත් පියවා නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව කටයුතු කරන බව. | අත්තිකාරම් දින 14ක් ඇතුළත පියවීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| viii. මුදල් රෙගුලාසි 454 (1) | ගොවිජන සේවා කාරක සභා 07 ක ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතු අතර, එසේ නොකළ පාර්ශව |

| | | | |
|---|---|---|---|
| | | | වෙත පියවර ගත යුතුය. |
| ix. මුදල් රෙගුලාසි 880 | ගොවිජන සේවා කාරක සභා 13 ක මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා බලය ලබාදී ඇති සියලුම සේවකයින් විසින් ඇප තැබිය යුතු වුවද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් විසින් ඇප තබා නොතිබුණි. | ඇප තැබීමේ අවශ්‍යතාවයක් නොමැති බව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දී ඇති බව. | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගෙන් ඇප තැන්පතු ලබාගත යුතුය. |
| (ඇ) ගොවිජන සේවා කොමසාරිස්ගේ 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය | | | |
| i. 03 (ඉ) වගන්තිය | සියළුම ගනුදෙනු නියමිත ගිණුම් පොත්වල ක්‍රමවත්ව සහ කලට වේලාවට ඇතුළත් කළ යුතු වුවද කාරක සභා 03ක එපරිදි කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව සියළුම ගනුදෙනු නියමිත ගිණුම් පොත්වල ක්‍රමවත්ව සහ කලට වේලාවට ඇතුළත් කළ යුතු අතර, එසේ නොකළ පර්ශව වෙත පියවර ගත යුතුය. |
| ii. 21(2) ඡේදය | ගොවිජන සංවර්ධන නිලධාරී විසින් තොග පොත්වල සටහන් නිවැරදි බවට සෑහීමට පත්වීම සඳහා අඩු වශයෙන් දෙසතියකට වරක්වත් පරීක්ෂා කර අත්සන් කළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 10 ක එකී උපදෙස්වලට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර තොග ලේඛන සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂාවට ලක්කර නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව අඩු වශයෙන් දෙසතියකට වරක්වත් පරීක්ෂා කර අත්සන් කළ යුතු අතර, එසේ නොකළ පර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2013 මාර්තු 08 දිනැති 7/5/3-1/40 දරන චක්‍රලේඛයේ යෝජනා අංක 07 | අතිරික්ත මුදල් අඩු අවධානම්කාරී ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර පොළී ආදායමක් ඉපයීම කෙරෙහි අවධානය යොමු කළයුතු වුවත්, කාරක සභා 05ක් විසින් එපරිදි කටයුතු නොකර රු.28,227,526 ක් කාරක සභාවේ ඉතිරි කිරීම් සහ ජංගම ගිණුම්වල රඳවාගෙන තිබුණි. | වීරවිල කාරක සභාව 2025 වර්ෂයේදී රු.1,000,000 ක ශේෂයක් ආයෝජනය කර ඇති බව. | විධිමත් අනුමැතිය මත අඩු අවධානම්කාරී ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර පොළී ආදායමක් ඉපයීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2014 අගෝස්තු 22 දිනැති චක්‍රලේඛ අංක 07/2014 (107 සංශෝධන III) හි 02 වගන්තිය | මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ බැංකු පහසුකම් නොමැති අවස්ථාවල රඳවාගත හැකි අත ඉතිරි මුදල රු.10,000කට නොවැඩි විය යුතු අතර, 16 වගන්තිය අනුව උපරිම සීමාවට වැඩි මුදලක් මුදල් භාරකරු රඳවාගෙන නැති බවට මධ්‍යස්ථාන විධායක ලේකම් විසින් සෑහීමට පත්විය යුතු බව දක්වා ඇතත්, කාරක සභා 13ක් විසින් එකී විධිවිධානවලට අනුකූල නොවී දෛනිකව මුදල් අත රඳවාගෙන තිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඊ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2020 නොවැම්බර් 02 දිනැති 7/5/12 ගි.වා.පොදු ලිපියේ 05 ඡේදය | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් නිවැරදි ගිණුම් වාර්තාවන් සකස් කරවීම පිළිබඳව අවධානය යොමු කර, ගිණුම් වාර්තා නිවැරදිව පරීක්ෂා කර අඩුපාඩු නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළයුතු වුවත්, මීගස්ආර ගොවිජන සේවා කාරක සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව කටයුතු කරන බව. | ගොවිජන සේවා කාරක සභා ගිණුම් වාර්තා නිවැරදිව පිළියෙළ කරන බවට සහතික විය යුතුය. |
| (උ) | ගොවිජන සේවා කොමසාරිස්ගේ 2022 දෙසැම්බර් 13 දිනැති චක්‍රලේඛ අංක 04/2012 (සංශෝධන vii) | ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියක තබා ගත යුතු අත ඉතිරියෙහි උපරිම සීමාව රු.50,000 ක් වුවත්, කාරක සභා 06ක එකී සීමාව ඉක්මවා දෛනික මුදල් අත ඉතිරිය රඳවාගෙන තිබුණු අවස්ථා පැවතුණි. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2023 අප්‍රේල් 24 දිනැති අංක 01/2023 දරන චක්‍රලේඛය | | | |
| i. 6 (10) වගන්තිය | ණය නිකුත් කරන අවස්ථාවේදී ඊට අදාළ ගොවි ආපදා ණය ආවරණ ගිණුමේ ගොවි දායකත්වය අනුමත වූ ණය මුදලින් අවකරණය කර ගොවි ආපදා ණය ආවරණ ගිණුමට බැර කළයුතු වුවත්, වීරකැටිය ගොවිජන සේවා කාරක සභාව 2024 වර්ෂයේදී නිකුත් කළ රු.6,435,000 ක් වූ ණය සඳහා රු.42,350 ක ගොවි ආපදා ණය ආවරණය අයකර ගෙන නොතිබුණි. | 2025 වර්ෂයේදී නිවැරදිව කටයුතු කරන බව. | ණය නිකුත් කරන අවස්ථාවේදී ඊට අදාළ ගොවි ආපදා ණය ආවරණ ගිණුමේ ගොවි දායකත්වය අනුමත වූ ණය මුදලින් අවකරණය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| ii. 7 වගන්තිය | සෑම කාර්තුවක් අවසානයේදීම ආපදා ණය ආවරණ ගිණුමෙහි රැස්වූ මුදල්, ආපදා අරමුදල් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කළ යුතු වුවත් කාරක සභා 03 ක් විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ආපදා ණය ආවරණ ගිණුමෙහි රැස්වූ මුදල්, ආපදා අරමුදල් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කළ යුතුය. |
| (එ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2024 පෙබරවාරි 20 දිනැති අංක 7/5/9 (අ.ප්‍ර) - දරන ලිපියෙහි 1.5 ඡේදය | කල් ඉකුත් වූ තොග කපාහැරීම සඳහා ඉදිරියේදී අනුමැතිය ලබානොදෙන හෙයින් අලෙවි ද්‍රව්‍ය තොග කල් ඉකුත් වීමට පෙරාතුව අලෙවි කිරීමට හෝ මාරු කර ගැනීම තොග භාර නිලධාරියාගේ වගකීමක් වුවද, එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් ගොවිජන සේවා කාරක සභා 08 ක සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කල් ඉකුත් වූ තොග ගබඩාවෙහි රඳවා ගෙන තිබුණි. | අපහරණය කිරීම සහ තොග කපා හැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇති බව. | විධිමත් පරීක්ෂාවක් කර උපදෙස් ලිපිය අනුව කටයුතු නොකළ නිලධාරීන්ගෙන් සිදුවූ පාඩුව අයකරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ගොවිජන සේවා කාරක සභා 14 ක 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එකතුව රු.13,839,365 ක අතිරික්තයක්ද, ගොවිජන සේවා කාරක සභා 03 ක එකතුව රු.1,113,496 ක ඌනතාවයක් සහ ගොවිජන බැංකු 17 ක එකතුව රු. 6,517,427 ක ශුද්ධ ලාභයක්ද, විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1994 අංක 06 දරණ පනතින් සංශෝධිත 1980 අංක 33 දරන පලිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 21(අ)(I) වන වගන්තියට අනුව දිවයින තුළ ක්‍රියාත්මක පලිබෝධනාශක වෙළඳසැල් සියල්ලම පලිබෝධනාශක අලෙවි සහතිකයක බලය යටතේ අලෙවිය සිදුකළ යුතු වුවත්, බඳගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් පිළිබෝධනාශක අලෙවිසැල් සඳහා අලෙවි බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | බලපත්‍රය ලබා ගැනිම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමහ සාකච්ඡා කර ඇති බව | පලිබෝධනාශක පාලනය කිරීමේ පනත අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ආ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ "කෘෂි යන්ත්‍රෝපකරණ ආරක්ෂා කිරීම හා සේවයේ යෙදවීම" මැයෙන් වූ 2015 ජුනි 22 දිනැති අංක 10/2015 දරන චක්‍රලේඛය මගින් ලබාදී ඇති උපදෙස් අනුව, සියලු යන්ත්‍ර අව් - වැසි වලින් ආරක්ෂා කර ගැනීම සඳහා පියවරගත යුතු බව දක්වා ඇතත්, ට්‍රැක්ටර් රථ ආවරණය නොකළ එළිමහනක පවතින බව නිරීක්ෂණය වූ අතර චක්‍රලේඛයේ (ඇ) ඡේදයෙහි සඳහන් පරිදි යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාවන් නියමිත ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් සිදුකළ යුතු බව දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂයේදී ආදායම් ඉපයීමට භාවිතා කර තිබුණු ට්‍රැක්ටර් රථයක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට බෙරලිහෙල ගොවිජන සේවා කාරක සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වහලය කම්බි වියදමින් සකස් කළ නමුත් වඳුරන් හා රිලවුන් විසින් කඩා දමා ඇති අතර ට්‍රැක්ටර අමතර කොටස් යොදා සකස් කර ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමක පවතින බව ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් දැනුවත් කර ඇති බව | සමාලෝචිත වර්ෂයේදී ආදායම් ඉපයීමට භාවිතා කර තිබුණු ට්‍රැක්ටර් රථය භාවිතයට ගැනීමට—නොහැකිනම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘෂිකර්ම පර්යේෂණ නිලධාරී වෙත නිකුත් කර තිබුණු රු.112,300 ක් වටිනා | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | පොහොර වර්ග 05 කට අදාළ මුදල් මාස 04 ත් 09 ත් අතර කාලයක් ගත වුවද ඒවා නැවත අයකර ගැනීමට මයුරපුර ගොවිජන සේවා කාරක සභාව විසින් කටයුතු කර නොතිබුණි. | | යුතු අතර, කාලීනව අය කිරීම් නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඈ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2015 ජුනි 22 දිනැති අංක 9/2015 චක්‍රලේඛය අනුව කාරක සභාව විසින් රජයේ ආයතන වෙත කාමර කුලියට ලබාදීමේදී වර්ග අඩියකට රුපියල් 20 ක් අයකළ යුතු වුවද වලස්මුල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වර්ග අඩියකට රු. 15 ක් බැගින් පමණක් අයකර තිබූ බැවින් රජයේ ආයතන 03 කින් රු. 239,120 ක කාමර කුලී හිඟව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | කඩකාමර කුලී චක්‍රලේඛය ප්‍රකාරව අයකිරීම සහ හිඟ කුලිය කඩිනමින් අයකර ගැනීමටත්, කාලීනව අය නොකළ පාර්ශව වෙත පියවර ගැනීමත් කළ යුතුය. |
| (ඉ) | වීරකැටිය ගොවිජන සේවා කාරක සභාවෙහි එකතු වටිනාකම රු.51,665 ක් වූ පොහොර තොග අලෙවි කිරීමට හෝ කල් ඉකුත්වීමට පෙර මාරුකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2025 ජනවාරි 26 දින වන විටත් එම තොගයෙන් රු.6,625 ක් වූ පොහොර තොග කල් ඉකුත් වී තිබූ අතර, එකතු වටිනාකම රු.45,040 ක් වූ පොහොර තොග මිලදී ගෙන වර්ෂ 02 කට අධික කාලයක් වූයෙන් දරන ලද රු.51,665 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | කල් ඉකුත් වූ තොග අපහරණය කර ඇති බව. | විධිමත් පරීක්ෂාවක් සිදුකර තොග කල් ඉකුත් වීමට ප්‍රථම මාරුකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ගෙන් අලාභය අයකරගත යුතුය. |
| (ඊ) | උඩයාල ගොවිජන සේවා කාරක සභාව විසින් සී/ස ලංකා පොහොර සමාගම මගින් 2023 පෙබරවාරි 15 දින රු.181,815ක් දරා මිලදීගෙන තිබුණු එළවළු පොහොර තොග විගණිත දිනය වූ 2025 මාර්තු 14 දින වන විටත් ගබඩාවේ තිබුණු අතර, එම පොහොර තොගය සඳහා දරන ලද වියදමද ඒ අනුව නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | පොහොර තොග මිළට ගෙන කෙටි කාලයකින් විවෘත වෙළඳපොළෙහි මිළ ගණන් අඩු වූ අතර මිළ සංශෝධනය කිරීම සඳහා අදාළ සමාගම හා දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇති බව. | පොහොර තොගය අලෙවි කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 / 2024 මහ කන්නය සඳහා රජය විසින් ගොවීන් වෙත නොමිලේ බෙදාහැරීමට ගොවිජන සේවා කාරක සභාවට ලබාදී තිබූ TSP හා යූරියා පොහොර 1463kg ක් ගොවීන් වෙත බෙදාහැරීමට කටයුතු නොකර බඳගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් ගබඩා කර තිබුණි. | 2023/24 මහ නොමිලේ ගොවින් වෙත නිකුත් කිරීමෙන් පසු ඉතිරි යූරියා 1350kg හා TSP 113Kgක් ප්‍රමාණය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිලිබඳ ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ උපදෙස් ඉල්ලා ඇති බව. | අවශ්‍යතාවය මත පොහොර තොග ගොවීන් වෙත බෙදාහැරීමට කටයුතු කළ යුතුය |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 09 කට අයත් ගොවිජන සංවර්ධන නිලධාරී නිල නිවාස 09ක්,අලෙවිසැල් 02ක්, ජල උසමාපක 19ක්, තෙල් ඉසින යන්ත්‍ර 04ක්, ඡායා පිටපත් යන්ත්‍රය 02ක්, ට්‍රැක්ටර් 08ක්, ට්‍රේලර් 03ක්, කාබනික අතු කැබලි යන්ත්‍රයක්, නගුල් 01ක්, මඩ වීල් 04ක්, මුද්‍රණ යන්ත්‍ර 03ක්, ස්කැනර් යන්ත්‍ර 03ක්, සේප්පු 03ක්, ඇඹිලි සළකුණු යන්ත්‍ර 01ක්, පැළ කූටි 01ක්, පොහොර ගබඩා 01ක්, ලැප්ටොප් යන්ත්‍ර 01ක් හා පොහොර නිෂ්පාදන යන්ත්‍ර 01ක් නිශ්කාර්යව පැවතුණි. | නිල නිවාස සහ අලෙවිසැල් අලුත්වැඩියා කර ගැනීමට, යන්ත්‍ර හා උපකරණ අපහරණය කිරීමට, වෙනත් ආයතනයන්ට ලබාදීමට, වෙන්දේසි කිරීමට සහ ලබාදුන් ආයතනයට නැවත හරවා යැවීමට කටයුතු කරන බව. | භාවිතයට ගතහැකි වත්කම් හා උපකරණ ප්‍රයෝජනයට ගැනීමටත්, අනිකුත් වත්කම් හා උපකරණ විධිමත් අනුමැතිය මත අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 ඡේදය අනුව මුදල් සැපයීමේ මූලාශ්‍රය නොතකා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සියලුම ප්‍රසම්පාදන වලට අදාළ වන බව දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂයේදී කාරක සභා 11 ක් විසින් එකතුව රු.25,146,867ක බිත්තර වී සහ රසායනික පොහොර මිලට ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලදී ගැනීම් සිදුකර තිබුණි. | කාරක සභා 05 ක් ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරන බවත්, ඉතිරි කාරක සභා විකුණා මුදල් ගෙවීමේ පදනම මත සහ සහකාර කොමසාරිස් විසින් අනුමත කළ ආයතන හා පුද්ගලයන් වෙතින් මිලදීගත් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, ඊට අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 15ක කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර තනතුරු 197ක්, මධ්‍යස්ථාන කළමණාකරණ සහකාර තනතුරු 07ක්, ගොවිජන සංවර්ධන නිලධාරි තනතුරක්, මධ්‍යස්ථාන කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර තනතුරක් ගොවිබැංකු කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර තනතුරක් හා සංවර්ධන නිලධාරි තනතුරු 08ක් පුරප්පාඩුව පැවති අතර නෙටොල්පිටිය ගොවිජන සේවා කාරක සභාවෙහි සංවර්ධන නිලධාරි තනතුරු 04ක් අතිරික්තව පැවතුණි. | මේ පිළිබඳව දිස්ත්‍රික් කාර්යාලය මගින් ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඇති බව | කාර්ය මණ්ඩල සමාලොචනයක් සිදු කර රජයේ ප්‍රතිපත්ති අනුව, අතිරික්තතා, ඌණතා සම්බන්ධව කටයුතු කළ යුතුය. |

**4. ගොවිජන බැංකු කටයුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවි බැංකු 13ක් මගින් ගොවීන් වෙත ලබාදී තිබුණු ණයවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු. 9,192,362 ක ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | කාරක සභා 02ක් විසින් රු.1,463,470ක ණය ශේෂ අයකරගැනීමට කටයුතු කර ඇති අතර රු. 6,876,586 ක ණය ශේෂ අයවෙමින් පවතින බව හා රු.852,306ක ණය ශේෂ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, කාලීනව අය නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |